16

# දෙවන භාෂාව ඉගෙනීම හා ජාතික සමගිය

**හැටන් දෙමළ මහා විද්‍යාලයේ සිංහල භාෂා සංගමයේ දී "දෙවන බස ඉගෙනීම හා ජාතික සමගිය" යන මාතෘකාව යටතේ කරුණාකරන් ශිෂ්‍යයා පැවැත්වූ කථාවේ පිටපතකි.**



සිංහල භාෂා සංගමයේ සභාපතිතුමා හා ලේකම්තුමාගෙන් අවසරයි, ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන් ද අවසරයි, දයාබර සහෝදර සහෝදරයනි, අද දින මගේ කතාව වන්නේ දෙවන භාෂාව ඉගෙනීම හා ජාතික සමගියයි. මෙහි දී මගේ අත්දැකීම් කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

දෙවන භාෂාවක් කියලා කියන්නේ මොකක් ද? අපි කාටත් මව් භාෂාවක් තියෙනවා. අපි ඒ භාෂාවෙන් කතා කරනවා. අපේ අවශ්‍යතා ඉටු කර ගන්නවා. වෙනත් භාෂා කතා කරන අයත් අපේ සමාජයේ ඉන්නවා. ඒ අය එක්කත් අපට ගනුදෙනු කරන්න වෙනවා. ඒ සඳහා ඒ අයගේ භාෂාව අපට පාවිච්චි කරන්න වෙනවා. එහෙම පාවිච්චි කරන බසයි දෙවන බස. අපේ රටේ සිංහල අය දෙවන බස විදියට දෙමළ ඉගෙන ගන්නවා. දෙමළ සහ මුස්ලිම් අය දෙවන බස ලෙස සිංහල ඉගෙන ගන්නවා. මගේ අත්දැකීම් මගින් තවදුරටත් පැහැදිලි කරන්නම්. මම කරුණාකරන්. නාවලපිටියේ උපන්නේ. තාත්තා දෙමළ. මගේ අම්මා සිංහල. ගම කෑගල්ලේ. අපේ ගෙදර කතා කරන්නේ දෙමළ. ඒ නිසා මගේ මව් භාෂාව දෙමළ. මම දෙවන භාෂාවක් විධියට සිංහල ඉගෙන ගන්නවා. මට සිංහලත් කතා කරන්න පුළුවන්. මම නිවාඩු කාලෙට අම්මගේ ගමේ යනවා. එහෙ යාළුවොත් ගොඩක් ඉන්නවා. ඒ අයට දෙමළ කතා කරන්න බෑ. ඒ වුණාට මම සිංහලෙන් කතා කරනවා. මගේ සමහර වචනවලට ඒ අය හිනා වෙනවා. පසු ව ඒ අය නිවැරදි ව කියලා දෙනවා. අපි නිතර ම සෙල්ලම් කරනවා. හරි ම විනෝදෙන් ඉන්නේ. සිංහල යාළුවො මට කතා කරන්නේ "කරුණා" කියලා. ඒ අය මට ආදරෙයි. මගේ අම්මයි තාත්තයි දෙන්නත් ඒ අයට ආදරෙයි.

අපි අවුරුදුවලට කෑගල්ලේ සිංහල නෑයන්ගේ ගෙවල්වල ගියා. ඒ ගොල්ලොත් අපේ ගෙදර ආවා. මට කැවුම්, කොකිස්, කිරිබත් කන්න දුන්නා. මමත් ආශාවෙන් කෑවා. ඒ අය නාවලපිටියට ආවා ම අපේ අම්මා ඒ ගොල්ලන්ට වඩේ හදලා දුන්නා. කෑගල්ලේ දී මම අවුරුදු උත්සවයකට සහභාගි වුණා. මටත් තෑග්ගක් ලැබුණා. ඒ පොත් කට්ටලයක්. එහි කතා පොතක් තිබුණා. ඒකේ නම මඩොල් දූව. මම ඒක ගෙදර දී අම්මගෙන් අහගෙන කියෙව්වා. ඒක හරි ම රසවත් පොතක්. සිංහල අයගේ සිරිත් විරිත්, පුරුදු තේරුම් ගන්න මට මගේ සිංහල දැනුම ප්‍රයෝජනවත් වුණා. ඒ විතරක් නෙවෙයි, සිංහල යාළුවන්ට දෙමළ අය ගැන තොරතුරු කියන්නත් මට මගේ සිංහල දැනුම ප්‍රයෝජනවත් වුණා.

ඉතිං සහෝදර සහෝදරියනි, දෙවන බස ඉගෙනීමේ ප්‍රයෝජන, දෙවන බසෙහි අගය හා දෙවන බස යොදා ගන්නා අවස්ථා මගේ අත්දැකීම් අනුව මං විස්තර කළා. දෙවන බස භාවිත කරන්නේ කොයිවගේ තැන්වලදී ද, එය යොදා ගන්නේ කෙසේ ද? එය මගේ ම අත්දැකීම්වලින් තවත් පහදන්නම්.

ගිය අවුරුද්දේ අපේ පාසලේ අධ්‍යාපන චාරිකාවට මමත් සහභාගි වුණා. බස් එකේ දී දෙමළ සිංදු ගයමින් අපි විනෝද වුණා. මම විතරක් සිංහල සිංදු කිහිපයක් ගැයුවා. අපේ යාළුවෝ ඒවා අහලා හුඟක් සතුටු වුණා. යටියන්තොට කිට්ටුව දී එක පාරට ම බස්එකේ රෝදයක හුළං ගියා. මම රියැදුරු මාමා එක්ක ළඟ තිබුණ කඩයකට ගියා. බස් එකේ සිටි අය සිංහල දන්නේ නෑ. මම සිංහලෙන් කතා කරලා උදව් ඉල්ලුවා. ඒ අය අපට ගොඩාක් උදව් කළා. රියැදුරු මාමා මට කිව්වා, ඔයා සිංහල දන්න නිසා අපට පහසු වුණා කියලා. මට හරි සතුටක් දැනුණා.

අපි ඉක්මනට ගාලු ගියා. ගාලු කොටුවේ දී මං සිංහල අය එක්ක සිංහලෙන් කතා කළා. ඔවුන් මට ස්තුති කළා. අපි කොග්ගල ගියා. මාර්ටින් වික්‍රමසිංහ මහතා ගැන කතා කළේ සිංහලෙන්. මං සිංහල දන්න නිසා යාළුවෝ මගෙන් ඒ විස්තර ඇහුවා. මං ඔක්කොට ම දෙමළෙන් විස්තර කියලා දුන්නා. අතරමග දී අපේ සිවාට බස් එකේ වමනය ගියා. ළඟ තැනක දොස්තර මහත්මයෙකුට එයා පෙන්නුවා. දොස්තර මහත්තයා ඇහුව ප්‍රශ්නවලට මමයි උත්තර දුන්නේ. දොස්තර මහතාත් මට ස්තුති කළා.

ඉතිං මං හිතනවා මගේ අත්දැකීම් දෙවන භාෂාවක අගය වැටහෙන්න ප්‍රමාණවත් ඇති කියා. මගේ පාසලේ යාළුවොයි, කෑගල්ලේ යාළුවොයි මගේ අඹ යාළුවෝ. ඒ අය එක්ක සම්බන්ධකම් තියා ගන්න පුළුවන් වෙන්නේ මම සිංහල, දෙමළ භාෂා දෙක ම දන්න නිසා.

මට හිතෙනවා භාෂාව හරි පුදුමයි කියලා. දෙවන බසක් දැන ගැනීම ඉතා ම ප්‍රයෝජනවත්. එකිනෙකා අතර ආදරය ඇති කරනවා. සමගිය ඇති කරනවා. විශ්වාසය ඇති කරනවා. නෑ හිතවත්කම් ඇති කරනවා. සුහදත්වය ඇති කරනවා. මිත්‍රත්වය ඇති කරනවා.

ඔවුන්ගේ අදහස් අපට තේරෙනවා. අපේ අදහස් ඔවුන්ට තේරෙනවා. ඔවුන්ගේ ප්‍රශ්නවලට අපට උත්තර දෙන්න පුළුවන්. දෙගොල්ලන්ට ම අදහස් ප්‍රකාශ කිරීමෙන් තම තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි වෙනවා.

දෙවන බසක් ඉගෙනීමෙන් සාමය සමගිය ඇති වන බව සැමට අවබෝධ වෙනවා ඇති. දැනට මේ ඇති. මම මගේ කතාව අවසාන කරනවා. අසා සිටි ඔබ සැමට ස්තූතියි.

## ක්‍රියාකාරකම්

01). "දෙවන බස ඉගෙනීම හා ජාතික සමගිය" පාඩමෙහි කරුණාකරන්ගේ අත්දැකීම් තමන්ගේ අත්දැකීම් යැයි සිතා පන්තිය ඉදිරියේ කථාවක් ඉදිරිපත් කරන්න.

02). පාඩමෙහි දැක්වෙන ආකාරයට දෙවන බස ඉගෙනීමෙහි ඇති ප්‍රයෝජන කිහිපයක් ප්‍රකාශ කරන්න.

03). ඉහත කතාවේ ඉදිරිපත් වූ කරුණු සැලකිල්ලට ගෙන කතා සැකිල්ලක් සකස් කරන්න.

උදා: i අවසර ලබා ගැනීම.

ii

iii

iv

v

4). පහත සඳහන් ඡේදයෙහි ඇති ප්‍රධාන කරුණු ලියන්න.

"මට හිතෙනවා භාෂාව හරි පුදුමයි කියලා. දෙවන බසක් දැන ගැනීම ඉතා ම ප්‍රයෝජනවත්. එකිනෙකා අතර ආදරය ඇති කරනවා. සමගිය ඇති කරනවා. විශ්වාසය ඇති කරනවා. නෑ හිතවත්කම් ඇති කරනවා. සුහදත්වය ඇති කරනවා. මිත්‍රත්වය ඇති කරනවා."

05). පහත සඳහන් වචන යොදා වාක්‍ය ලියන්න.

i මවුබස
ii ගනුදෙනු
iii සිරිත්විරිත්
iv පොත් කට්ටලය
v එකපාර ම
vi අඹයහළුවෝ

**භාෂා භාවිතය**

01). පහත සඳහන් වාක්‍ය ලිඛිත බසට හරවා ලියන්න.

- i අපි සිංහලෙන් කතා කරනවා.
- ii මම නිවාඩු කාලෙට ගමේ යනවා.
- iii අපි නිතර ම සෙල්ලම් කරනවා.
- iv අපි අවුරුදුවලට ගෙවල්වලට ගියා.
- v අපේ අම්මා වඩේ හදලා දුන්නා.
- vi මම පොතක් කියෙව්වා.
- vii මගේ අත්දැකීම් මං විස්තර කළා.
- viii මම සිංහල සිංදු කිහිපයක් කිව්වා.
- ix මම වටපිට බැලුවා.
- x අපි ඉක්මනට ගාලු ගියා.

## 02). පහත ඡේදය ලිඛිත බසට හරවා ලියන්න.

අපි ඉක්මනට ගාලු ගියා. ගාලු කොටුවේ දී මං සිංහල අයත් එක්ක සිංහලෙන් කතා කළා. ඔවුන් මට ස්තුති කළා. අපි කොග්ගල ගියා. මාර්ටින් වික්‍රමසිංහ මහතා ගැන කතා කළේ සිංහලෙන්. මං සිංහල දන්න නිසා යාළුවෝ මගෙන් ඒ විස්තර ඇහුවා. මං ඔක්කොට ම දෙමළෙන් විස්තර කරලා දුන්නා.

## 03). මේ කතාව කියවන්න

## ලබු ගෙඩියේ තොවිලය

එදා ගමරාලගේ ගෙදර තොවිලයකි. ගමහාමිනේගේ අසනීප ගති නැති කිරීම මේ තොවිලයේ අරමුණ විය. ගමගෙය කුඩා එකකි. එබැවින් තොවිලය මිදුලේ සූදානම් කර තිබුණි. ටික වේලාවකින් මහ වැස්සක ලකුණු පහළ විය. දන් කරන්නට දෙයක් නැත. කවුරුත් වටපිට බැලූහ. තොවිලය සඳහා ගෙනා විශාල ලබු ගෙඩිය පසෙක විය. ලබු ගෙඩිය ඇතුළේ තොවිලය කිරීමට කවුරුත් තීරණය කළහ. පසු ව ලබු ගෙඩියේ කැල්ලක් කපා කවුරුත් ලබු ගෙඩිය ඇතුළට ගියහ. ඉන් පසු කැපූ කැල්ලෙන් දොරටුව වසන ලදි.

වැස්ස එන්න එන්න ම අධික විය. ජලය සමඟ ලබු ගෙඩිය පාවී ගියේ ය. එය ගඟට වැටී ගඟෙන් මුහුදට ගසාගෙන ගියේ ය. ලබු ගෙඩිය දුටු ලොකු මෝරෙක් එය ගිල දැමී ය.

දිනක් මාළු අල්ලමින් සිටි ධීවරයකුගේ දැලට මෝරා අසු විය. මෝරා දුටු ධීවරයා ඌ ගෙදර ගෙන ගියේ ය. ධීවරයාගේ බිරිඳ මෝරා කපන විට උගේ බඩේ තිබූ ලබු ගෙඩිය දෙපලු කරත් ම "ඩෙන්න ඩෙනා ඩෙනෝ" කියමින් තොවිල්කරුවෝ එළියට පැමිණියහ. එහෙත් තවමත් තොවිලය ඉවර නැත.

**මෙසේ කෙටිකර ලිවීම සාරාංශය යි.**

සාරාංශයක් ලිවීමේ දී,

i දී ඇති ඡේදය හොඳින් කියවන්න.
ii ප්‍රධාන අදහස (වැදගත් කරුණු) සිතට එනතුරු කියවන්න.
iii ප්‍රධාන කරුණු සටහන් කර ගන්න.
iv උපමා, රූපක, නිදසුන් විස්තර වර්ණනා ඉවත් කරන්න.
v ඉන්පසු කරුණු අනුපිළිවෙළින් ඇතුළත් වන සේ කෙටියෙන් ලියන්න.
vi සාරාංශයේ වචන ගණන සඳහන් කර නැති විට, දී ඇති වචන ගණනින් $^1/_3$ ක් වන සේ සාරාංශය ලියන්න.

**04).** පහත දැක්වෙන ඡේදය කියවා එහි දී ඇති වචනවලින් $\frac{1}{3}$ වන සේ සාරාංශ කර ලියන්න.

පෙරහරින් ගමන් ගත් රජු හා කුමාරයා තමන්ගේ රටට ඇතුළු වූ බව දැන ගත් රටවැසියෝ වැළ නොකැඩී පැමිණියෝ ය. මේ පුවත රටේ ඈත ගම් දනව්වල පැතිර ගියේ ය. ආරංචිය ලැබුණ සෑම ප්‍රදේශයක ම වැසියෝ තොරණ බැඳ කොඩි වැල් ඇද මං මාවත් සැරසිලිවලින් අලංකාර කළෝ ය. පිය රජතුමා සමඟ ගමන් කරන පුත් කුමරුවා ඉදිරියට පැමිණි රටවැසියෝ අතිමහත් වූ ගෞරවාදරයෙන් යුතු ව ඔහුට ශුභ ප්‍රාර්ථනා කරමින් දීර්ඝායුෂ පැතූහ.

* රූපවාහිනියේ සහ ගුවන් විදුලියේ ප්‍රචාරය වන ප්‍රවෘත්ති විස්තරවලට හා ප්‍රවෘත්ති සාරාංශවලට සවන් දෙන්න.

* ඉන් එක් ප්‍රවෘත්ති විස්තරයක් හා ඊට අදාළ සාරාංශය අභ්‍යාස පොත්වල ලියන්න.

* උදේ රැස්වීමක දී විදුහල්පතිතුමා කළ දේශනයට සවන් දී එහි සාරාංශය අභ්‍යාස පොත්වල ලියා ගුරුතුමාට / ගුරුතුමියට පෙන්වා අඩු පාඩු ඇත්නම් ඒවා නිවැරදි කර ගන්න.

**පැවරුම්**

01). පහත සඳහන් කතා සැකිල්ල ප්‍රයෝජනයට ගෙන දී තිබෙන මාතෘකාවලින් එකක් යටතේ කතාවක් සකසන්න.

| | |
|---|---|
| **i** | **අවසර ගැනීම** |
| **ii** | **මාතෘකාව හැඳින්වීම** |
| **iii** | **කරුණු සංවිධානය** |
| **iv** | **සමාලෝචනය** |
| **v** | **ස්තුතිය (අවසන් කිරීම)** |

i ජාතික සමගිය

ii පිරිසිදුකම මිනිසා නිරෝගි කරයි.